


# ලංකාවේ මානව සම්පත්

රටක වාසය කරන ජන කොටස් වල සමස්ත ජීවන තත්වය සංසන්දනය කරන්නට නොයෙක් මිණුම් දඬු යොදා ගනු ලැබේ. සාමාන්‍යයෙන් අප මේ සඳහා යොදා ගනු ලබන්නේ වාර්ෂිකව සැබෑ දළ දේශීය නිෂ්පාදිතයේ ඇතිවී තිබෙන වෙනස, ඒක පුද්ගල ආදායම වැනි ආර්ථික සාධකවලට පමණක් සීමා වූ මිණුම් දඬුය. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන මේ සඳහා යොදා ගන්නේ මානව සංවර්ධන දර්ශකයයි. මෙම දර්ශකය සකස් කොට ඇත්තේ මානව ශුභ සාධනයේ වැදගත් අංශ තුනක් නියෝජනය කරන අයුරිනි. ඒ නම් සෞඛ්‍යය, අධ්‍යාපනය සහ යෝග්‍ය ජීවන මට්ටමක් යන අංශ තුනයි. මෙහිදී සෞඛ්‍යය යන අංශය ජීවන අපේක්ෂාව මගින් ද, අධ්‍යාපනය යන අංශය වැඩිහිටි සාක්ෂරතාවය සහ ප්‍රාථමික, ද්විතයික සහ තෘතීය පාසැල්වලට ඇතුල් කෙරෙන වාර්ෂික මුළු ශිෂ්‍ය සංඛ්‍යාව මගින් ද, යෝග්‍ය ජීවන මට්ටම යන අංශය ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය මගින් ද නියෝජනය කෙරෙයි. ආර්ථික සාධකවලට පමණක් සීමා වූ මිණුම් දඬු වලට වඩා මානව සංවර්ධන දර්ශකයට මා කැමැත්තක් දැක්වූවද මෙම මිණුම් දණ්ඩෙන් ද රටක වසන ජන කොටස් වල සමස්ත ජීවන තත්වය නියෝජනය කෙරෙන්නේ යයි මම කල්පනා නොකරමි.

එසේ කල්පනා නොකරන්නට හේතුව මෙයයි. ජන කොටසක යෝග්‍ය ජීවන මට්ටම නියෝජනය කරන්නට යොදා ගන්නා ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය මගින් සංවර්ධනය වන රටවල ජන කොටස් වල, විශේෂයෙන් ම ලංකාවේ, පංතිමය හෝ ජාතික හෝ ආගමික ගැටුම් තුලින් අපූරු අන්දමට ප්‍රකාශයට පත් වී තිබෙන්නාවූ නිදන්ගත ආකාරයේ සහ දරුණු මට්ටමේ ආර්ථික විෂමතාවය නියෝජනය නොකෙරෙන හෙයිනි. මෙම අඩුපාඩුව අත හැර දැමූවත් මානව සංවර්ධන දර්ශකය මගින් ඉදිරිපත් කෙරෙන්නේ ලාංකීය සමාජ ආර්ථිකයේ පැති කඩක කොටසක් පමණකි. ඒ නිසා එක්සත් ජාතීන්ගේ මානව සංවර්ධන වාර්තාව අපරිසමාප්ත එකක් පමණක් බව අමතක නොකළ යුතුය යන්න මගේ අදහස වෙයි.

2005 වර්ෂයේ මානව සංවර්ධන වාර්තාව දෙසට මඳක් හැරෙමු. රටවල් 177ක් සංසන්දනය කරන එම වාර්තාවට අනුව ශ්‍රී ලංකාව 99 වන ස්ථානය දරයි. ඕස්ට්‍රේලියාව, ඉන්දියාව සහ මියන්මාරය (බුරුමය) අංක 3, 128 සහ 132 යන ස්ථාන දරයි. 2008 අළුත් කරන ලද මානව සංවර්ධන වාර්තාවට අනුව ශ්‍රී ලංකාව 104 වන ස්ථානය ද, ඕස්ට්‍රේලියාව, ඉන්දියාව සහ මියන්මාරය (බුරුමය) අංක 4,


ගමේ ජීවිතය

132 සහ 135 යන ස්ථානද දරයි. මෙම චිත්‍රයෙන් පෙන්නුම් කරන්නේ සංසන්දනාත්මක තත්වය පමණක් හෙයින් 2008 අළුත් කරන ලද මානව සංවර්ධන දර්ශකයේ ප්‍රවණතා දෙස හැරී බලමු. ඒ අනුව 1980 සිට 2006 දක්වා වූ දිගු කාලීන ප්‍රවණතාවය 0.096 ක්ද, 1990 සිට 2006 දක්වා වූ මධ්‍යම කාලීන ප්‍රවණතාවය 0.058 ක්ද, 2000 සිට 2006 දක්වා වූ කෙටිකාලීන ප්‍රවණතාවය 0.019 ක්ද වෙයි. මෙහෙයින් ශ්‍රී ලංකාව මානව සංවර්ධනය අතින් මධ්‍යම ප්‍රමාණයේ වේගයක් අත්පත් කොට ගෙන තිබෙන රටක් ලෙස ප්‍රභේද කොට තිබේ. මෙම ප්‍රභේදයට ම අයත් වෙන ඉන්දියාව පිළිවෙලින් 0.181 කද, 0.114 කද, 0.048 කද, මියන්මාරය (බුරුමය) පිළිවෙලින් 0.096 කද, 0.099 කද, 0.034 කද මානව සංවර්ධන දර්ශක ප්‍රවණතා පෙන්නුම් කොට තිබේ.

අපේ රටේ ජනගහණය මිලියන 21 ඉක්මවා ගොස් ඇත. මෙයින් සියයට 90 කට ලියන්නට සහ කියවන්නට හැකිය. තවත් ලක්ෂ කිහිපයක් රටෙන් පිට ජීවත් වෙති. මෙම ජනගහණයෙන් සියයට 25 ක් පමණ වයස වසර 15ට අඩු අය වෙති. ජනගහණයෙන් සියයට 30 කට වඩා වැඩි ප්‍රමාණයක් වයස වසර 15 ත් 29 ත් අතර වන තරුණ පරම්පරාව ය. මුළු ජනගහණයෙන් සියයට 15 ක් පමණ නගරයේ වාසය කරති. 1971 දී සහ 1988-89 කාලය තුල ප්‍රධාන වශයෙන් සිංහල බෞද්ධ ලක්ෂයකට ආසන්න උගත් තරුණ පිරිසක් මරා දැමීමට ලක් විය. 1970 ගණන් වල සිට ඇති වූ දෙමළ ජනතාවගේ අරගලය හේතුවෙන් තවත් ලක්ෂයකට වැඩි ප්‍රධාන වශයෙන් තරුණ ජන කොටසක් ඝාතනයට ලක් විය. ජනගහණයෙන් සියයට 74 ක් පමණ සිංහලයෝ ය. සියයට 7 ක් පමණ මුස්ලිම් අය ය. සියයට 5 ක් පමණ වතුකරයේ දෙමළ ජනතාවගෙන් පැවතෙන අය යි. සෙසු සියයට 14 න් වැඩි පිරිසක් ලාංකීය දෙමළ ජනයාය.

මෙයින් පැහැදිලි වන කාරණය නම් ලංකාවේ ජන කොටස් අතරේ පැවතුන අන්තර් සම්බන්ධතා බිඳ දැමෙන අයුරින් සහ රටේ සම්පත් පවුල් කිහිපයක් අතරේ පමණක් ගොනුවන ආකාරයෙන් සකස් කරන ලද රාජ්‍ය ප්‍රතිපත්ති වර්ධනය කොට ක්‍රියාත්මක කිරීම නිසා ඇති වුන විනාශයන් නොවන්නට මානව සංවර්ධනය අතින් අපේ රටට කෙතරම් ඉදිරියට ගමන් කරන්නට අවස්ථාවක් තිබුනේ ද යන්නයි. ලාංකීය මානව ප්‍රජාවේ ප්‍රගතිය සහ සංවර්ධනය උදෙසා එම ප්‍රජාව තුළ පවතින විවිධත්වය, විචිත්‍රත්වය සහ බහුවිධ භාවය නම්‍ය ලෙසත්, ජනනාත්මකවත්, ප්‍රායෝගික ලෙසත් යොදා ගත හැකි ආකාරයෙන් කටයුතු කලේ නම්, අපේ මානව සම්පත් වල ඇති විවිධත්වයට සෑහෙන ස්වාධිපත්‍යයක් ඇතිව කටයුතු කළ හැකි ආකාරයට අධිකාරයක් සහ විධි ක්‍රමයක් සකස් කර ගෙන තිබුනේ නම් අපට දිගු ගමණක් මේ වන විට යා හැකිව තිබුන බව මගේ අදහස යි.

මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ දී බොහෝ විට මෙම තත්වයන්ට තුඩු දුන් හේතු නොසලකා හරිනු දක්නට තිබේ. සිංහල සහ දෙමළ ජන කොටස් දෙකේම කැරලිකාරී දේශපාලන කටයුතු පැන නැගුනේ 1960 අග භාගයේ දී පමණ ය. පවතින අසාධාරණ සමාජ ක්‍රමය වෙනස් කොට සමාජ-ආර්ථික සහ සංස්කෘතික විමුක්තිය අත් පත් කර ගැනීම සඳහා තරුණ කණ්ඩායම් සන්නද්ධ අරගලයේ මාවත තෝරා ගන්නේ මේ කාලයේ දී ය. මෙම තත්වය සිංහල සහ දෙමළ තරුණ කොටස් වලට කාලීන වශයෙන් සමපාත වීම වැදගත් කරුණක් ලෙස සලකමි. එවැනි සමපාත වීමකට හේතු ලෙස මා ප්‍රධාන වශයෙන් දකින්නේ මෙම තරුණ කොටස් දෙකොටසම බරපතල ලෙස පොදු වී පැවති කරුණු කිහිපයකි.

එම කරුණු නම්: මෙම දෙකොටසම පශ්චාත් 1948 වකවානුවේ ආණ්ඩු බලය සහ රාජ්‍ය බලය දරා සිටි ඉංග්‍රීසියෙන් අධ්‍යාපනය ලැබූ, ඉංග්‍රීසි භාෂාවෙන් සන්නිවේදනයේ යෙදුනු රදළ ඉඩම් හිමි සහ ව්‍යාපාරික පැලැන්තියේ අධිකාරය ප්‍රතික්ෂේප කිරීම යි. මෙම දෙකොටසම ග්‍රාමීය ව හැදී වැඩුණු සිංහල හෝ දෙමළ පමණක් කථා කල බෞද්ධයන් හෝ හින්දූන් වීම යි. ඔවුන්ගෙන් බහුතරයක් දෙනා කුලයෙන් 'බලවත්' යැයි සළකණු ලැබූ අය විසින් බොහෝ විට කුල පීඩණයට ලක් කොට කොන් කර තැබීමේ උත්සාහයන්ට ලක් වූ අය වීම යි. මෙම දෙකොටස ගේම අති බහුතරයක් දෙනා තම විධිමත් අධ්‍යාපනය ලබා තිබුනේ තම මව් භාෂාව වූ සිංහලෙන් හෝ දෙමළෙන් පමණක් වීම යි. ඔවුන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සන්නිවේදනයේ යෙදෙන්නට හැකියාවක් හෝ දක්ෂතාවයක් ලබා නොතිබීම යි. රැකියා ලබා ගැනීමට මෙම උගත් (බොහෝ විට උපාධිධාරී) තරුණ කොටස දැරූ උත්සාහයේ දී එතරම් උගත්කමක් නොලැබූ එහෙත් ඉංග්‍රීසියෙන් සන්නිවේදනයේ යෙදෙන්නට හැකි වූ 'ඉහළ' පෙලැන්තියේ (බමුණු කුලයේ) අයට රැකියා ලබා දීම යි. ඒ සමගම තම අධ්‍යාපනය සම්පූර්ණ කොට ආයතන වලින් පිට වෙන ප්‍රමාණයට සරිලන ආකාරයෙන් රැකියා අවස්ථා වර්ධනය නොකිරීම යි.


වතු කම්කරු ළඳක්

මෙම විග්‍රහයෙන් ක්ෂේත්‍ර ගණනාවක රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාවේ යෙදවීම පිළිබඳ ගැටළු විදහා දක්වන්නේ යයි සිතමි. මෙම ක්ෂේත්‍ර අතර අධ්‍යාපනය, රැකියා උත්පාදනය සහ කෙනෙකු උපන් සමාජමය පසුබිම අනුව කෙනෙකට වෙනස්කම් කිරීම, තරුණ ජනයාට තමන්ගේ පූර්ණ විභවය වර්ධනය කොට පරිශීලනය කර ගැනීම සඳහා තිබෙන අවස්ථා අහිමි කර දැමීම වැනි කරුණු ප්‍රධාන ස්ථානයක් දරයි.

ලබන කලාපයෙන් ලංකාවේ අධ්‍යාපන ප්‍රශ්ණ සහ ප්‍රතිපත්ති ගැන කථා කරමු.

ලයනල් බෝපගේ

Photo by Bernhard Kern




